කොවිඩ්-19 ලෝක ව්‍යාප්ත වසංගතය සම්බන්ධයෙන් කුමන්ත්‍රණ කල්පිතයන්ද ඇදෙන්නේ අද ඊයේක සිට නොවේ. කෙසේ නමුත් මෙවැනි කුමන්ත්‍රණ කල්පිතයන් සංසරණය වන බව හෝ සඳහන් කරන්නේ නම්, ජනමාධ්‍ය මගින් විශ්වසනීය සහ නිවැරදි මූලාශ්‍ර පරිශීලනය කිරීමත්, මෙවන් කුමන්ත්‍රණ කල්පිතයන්ට අභියෝග කෙරෙනා හෝ නිෂේධ කෙරෙනා මතයන්ද තම ලිපි තුළට ඇතුළත් කිරීමත් අවශ්‍ය වේ. අඩු තරමින් මේවා කරුණු ඔස්සේ සාධනය කර නොමැති "කල්පිතයන්" බව හා ඊට ප්‍රතිපක්ෂ මතයන්ද තිබෙන බව හෝ සඳහන් කළ යුතු වෙයි.

මෙසේ නියමිත ආකාරයේ ගවේෂණයකින් යුතුව නොලියවුණු ලිපියක් ලෙසින් පහත මව්බිම ලිපිය පෙන්වා දිය හැක. මෙම ලිපිය තුළ සාර්ස්-කොව්-2 වෛරසය ඇමරිකානු විද්‍යාඥයෙකුට විශාල මුදලක් ගෙවා චීනය විසින් මිලදී ගත් බවට පුවතක් මවමින්, චාල්ස් ලීබර් නම් මහාචාර්යවරයෙකු අත්අඩංගුවට ගෙන ඇති බව සඳහන් කෙරේ. කොවිඩ්-19 යනු කුමන්ත්‍රණයක්ද යන සැකය පාඨක සිත් තුළ ස්ථාපනය කිරීමට රචකයා විසින් එම කරුණද පදනම් කොටගෙන ඇත. කෙසේ වෙතත් ගැටළුව වන්නේ, චාල්ස් ලීබර් මහාචාර්යවරයා අත්අඩංගුවට ගැනී ඇත්තේ කොවිඩ්-19 හා කිසිසේත්ම සම්බන්ධ නොවෙනා වෙනත් කරුණක් මත බව මේ වනවිට ලෝකයේ ඇති විශ්වසනීය ලෙසින් පිළිගනු ලබන කරුණු විමසුම් කරනා සේවාවන් ඔස්සේ පවා තහවුරු වී තිබීමත්, එය මෙම ලිපිය ලියූ රචකයාට මග හැරී තිබීමත් වේ.

ලෝක ව්‍යාප්ත වසංගතයක් හා ලෝකයම සටන් වදිනා මෙවන් මොහොතක ජනමාධ්‍ය මගින් විශ්වසනීය හා නිවැරදිම මූලාශ්‍ර පරිශීලනය කරමින්, සමතුලිත වාර්තාකරණයන් ඉදිරිපත් කිරීමට උත්සුක වීමේ වැදගත්කම පෙන්වා දීමට අපි මෙය අවස්ථාව කර ගනිමු.

මූලාශ්‍ර:

https://www.factcheck.org/2020/02/no-link-between-harvard-scientist-charles-lieber-and-coronavirus/
https://www.poynter.org/?ifcn_misinformation=dr-charles-lieber-a-harvard-professor-was-arrested-for-creating-coronavirus-and-selling-it-to-china

#MediaethicsSL #SinhalaPress #lka #Mawbima.